## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/ 286 /2025 (PSC)**

චන්ද්‍රසිරි වෙත්තසිංහ ලියනගේ,
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
**වගඋත්තරකරු**

**දිනය :-2026.05.12**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සී.ඩබ්.ලියනගේ පුද්ගලිකව පෙනී සිටී.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් කේ.ඒ.එස්.එම්.රණසිංහ මිය.

### -<u>නියෝගය</u>-

### ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචක ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියේ නිලධාරියෙකු ලෙස සේවය කරමින් සිටියදී එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා **2025.09.04** දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී සේවා පළපුරුද්ද මත ලැබිය යුතු ලකුණු තමාට ලබා නොදී, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර ලබා නොදීමට එදිරිව මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කර සිටී. ඒ පිළිබඳව විමසා බලා තමාට එම තනතුර ලබා දෙන ලෙසට **2025.10.28** දින දරණ අභියාචනය මඟින් ඉල්ලා සිටී. ඊට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා **2026.04.19** දින ඇමුණුම් රැසක් සමගම කරුණු ඉදිරිපත් කර සිටී. ඊට අමතරව විවෘත අධිකරණයේ දී ද වාචිකව කරුණු දැක්වීම සිදුකරන ලදි.

අභියාචකගේ සියළු කරුණු වලට අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ,

(01) ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (කාර්මික අධ්‍යාපන) පුරප්පාඩුවක් පැවති බව සහ **2025.04.22** දැන්වීමට අනුව ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ බව.

(02) අභියාචක අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බව,

(03) 2025.09.04 දින අදාළ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ බව සහ අයදුම්කරුවන් තිදෙනෙක් ඉදිරිපත් ව සිටි බව,

(04) අනික් අයදුම්කරුවන් දෙදෙනා විනය පරීක්ෂණ වලට භාජනය වී ඇති චෝදනා ලබා සිටින නිලධාරීන් බව, (අභියාචක ප්‍රතික්ෂේප කරයි)

(05) තමා සියළු සුදුසුකම් සපුරා තිබූ බවත්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අමාත්‍යාංශ ප්‍රධානියාගේ නියෝග මගින් තමාට අසාධාරණයක් සිදුකළ බව,

(06) දෙපාර්තමේන්තු ප්‍රධානියා සමඟ පැවති ආරවුල් සහගත බව,

යන දීර්ඝව කරුණු ඉදිරිපත් කර සිටී.

මෙම කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින්ද තම නිරීක්ෂණ 2026.03.10 දින මෙම අධිකාරයට ඉදිරිපත් කර ඇත. ඊට අමතරව විවෘත අධිකරණයේ දී වාචික පැහැදිලි කිරීම් ද කරන ලදි.

මෙම නිරීක්ෂණ පිළිබඳව විමසා බැලීමට පෙර මේ පිළිබඳව අයදුම්පත්‍ර කැඳවන ලද ලේඛනය අනුව සුදුසුකම් මොනවාද යන්න විමසා බැලීම සුදුසුය. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කළ අයදුම්පත් කැඳවීමේ ලේඛනය අනුව සුදුසුකම් ලෙස දක්වා ඇත්තේ,

"**3. විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට සපුරාලිය යුතු සුදුසුකම්:-**

I. අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබාගෙන තිබීම, (අංක 2253/63 හා 2021.11.13 දිනැති ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාවේ පළමුවන සංශෝධනයේ 10.3.1 සපුරාලිය යුතු සුදුසුකම් යටතේ දක්වා ඇති පරිදි)

II. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක නිලධර ගණයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) උපයාගෙන තිබීම.

III. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට සුදුසුකම් ලබන සේවා ගණයේ/තනතුරු වල අදාළ විධායක ශ්‍රේණියේ වසර 18 කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්යය සාධනය සතුටුදායක හෝ ඊට ඉහළ මට්ටමක පැවතීම.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

4.4 සම්මුඛ පරීක්ෂණයේ ලකුනු පරිපාටිය පහත පරිදි වේ.

(අ) සේවා පළපුරුද්ද - (උපරිම ලකුණු 80)
ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ විශේෂ ශ්‍රේණියේ උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට සුදුසුකම් ලබන සේවා ගණයේ/තනතුරු වල අදාළ විධායක ශ්‍රේණියේ වසර 18කට නොඅඩු සක්‍රිය සේවා කාලය හා විධායක නිලධර ගණයේ වසර 18කට නොඅඩු සක්‍රිය සේවා කාලය හා විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයෙන් පසුව එළඹෙන සෑම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සඳහාම රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2019, 1/2020 හා ඒවායේ සංශෝධනයන්හි විධිවිධානයන් අනුව ලකුණු ලබාදෙනු ලැබේ.

(ආ) කුසලතාවය - (උපරිම ලකුණු 20)

1. අමතර අධ්‍යාපන සුදුසුකම් උපරිම ලකුණු 10
i. පශ්වාත් උපාධි සුදුසුකම සඳහා (එකකට ලකුණු 5 බැගින්) ලකුණු 10
ii. පශ්වාත් උපාධි ඩිප්ලෝමා සඳහා(එකකට ලකුණු 2.5 බැගින්) ලකුණු 05

සටහන 1- අයදුම්කරන නිලධාරීන් සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකමක් වන පශ්වාත් උපාධිය හෝ ඊට සමාන සුසුකමට අමතරව සම්පූර්ණ කර ඇති පශ්වාත් උපාධි සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. (රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 05/2020 හා ඒවායේ සංශෝධනයන්හි විධිවිධානයන් අනුව)

2. දේශීය හා විදේශීය පිළිගත් ආයතනයක වෘත්තීය ක්ෂේත්‍රයට අදාළව ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම් සඳහා උපරිම ලකුණු 05.

3. Power Point Presentation ලකුණු 05

ආදී වශයෙනි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අදාළ නිරීක්ෂණ අනුව දන්වා සිටින්නේ, අභියාචක අදාළ සුදුසුකම් සපුරා නැති බවයි. පහත ජේදයන් අනුව ඒ බව පැහැදිලි වේ.

**"7. තවද, අභියාචක විසින් ඉදිරිපත් කරන ලද විශේෂ ශ්‍රේණියට උසස් කිරීම මඟින් තනතුරට පත් කිරීමට අදාළ අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කර නොමැති බව නිරීක්ෂණය වේ. (ඇමුණුම VIII) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඩබ්.එල්.චන්ද්‍රසිරි මයාගේ නමට ඉදිරියෙන් විශේෂ සටහනක් යොදා, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බැවින් ලකුණු ලබා නොදෙන බවට සටහන් කර ඇත.(ඇමුණුම V)**

**8. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ පැහැදිලිව දක්වා ඇති පරිදි, තනතුරට පත්වීම සඳහා,**

**I. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක ගණයේ පළමු ශ්‍රේණියේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.**

**II. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්යය සාධනය සතුටුදායක හෝ ඊට ඉහළ මට්ටමක පැවතිය යන සුදුසුකම් සපුරා තිබීම අවශ්‍ය වේ.**

**9. නමුත් අභියාචක 2023 වර්ෂයේ කාර්ය සාධනය අසතුටුදායක බැවින් (ඇමුණම IX) මූලික සුදුසුකම් සපුරා නොතිබීම මත ලකුණු ලබා දෙනු නොලබන බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සටහන් කර ඇත."**

ඉහත නිරීක්ෂණ සහ ඇමුණම V ලෙස ඉදිරිපත් කර ඇති සම්මුඛ පරීක්ෂණ ලේඛනය සැසඳීමේ දී එය නිවැරදි බව තහවුරු වේ. අදාළ අයදුම්කරුවන් තිදෙනාම I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත්තේ 2019.03.15 දිනය. ඒ අනුව සමාන ලකුණු ප්‍රමාණයක් අදාළ තිදෙනාටම ලැබිය යුතු බව පෙනේ. අනිකුත් සුදුසුකම් යටතේ ලකුණු 10ක් ලබා ඇත. අමතර අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බවට අභියාචක කිසිදු සටහනක් හෝ පිළිගත හැකි සහතිකයක් ඉදිරිපත් කර නැත. එසේම තවත් ලකුණු 05ක් ලබාදෙන දේශීය/විදේශීය පිළිගත් ආයතනක වෘත්තීය ක්ෂෙත්‍රයට අදාළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් පිළිබඳව ද සඳහන් කර නැත. ඒ පිළිබඳව සහතිකයක් හෝ වෙනත් තොරතුරු කිසිවක් ඉදිරිපත් කර නොමැත. ඉදිරිපත් කිරීම සඳහා ලකුණු 05 ලබාදෙන අතර ඉදිරිපත් කිරීමක් සිදුකළ බවක් දක්නට නැත. එසේ ඉදිරිපත් කිරීම කලද අන් අයට මෙන් ලකුණු 5ක් හෝ අඩු ප්‍රමාණයක් අභියාචකට ද ලබා ගත හැකිව තිබුණි. කෙසේ වුවද අමතර අධ්‍යාපන සුදුසුකම් හෝ වෘත්තීය පුහුණුව පිළිබඳ ලකුණු ලබා නොගන්නේ නම්, ඒ අයට වඩා ඉහළ ලකුණු ලබා ගැනීමට අභියාචකට හැකියාව නොලැබේ. තෝරාගෙන ඇති නිලධාරීන් වෘත්තීය පුහුණුව වෙනුවෙන් කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමවක් විවෘත විශ්ව විද්‍යාලයෙන් ලබා ඇති බැවින් ලකුණු 2.5 ක් ඒ වෙනුවෙන් ලබා දී ඇත.

ඉහත කරුණු අනුව පෙනී යන්නේ අභියාචක දන්වා සිටින පරිදි, සම්මුඛ පරීක්ෂණයේ දි වරදක් සිදුවී නැති බවයි. අදාළ මූලික සුදුසුකම් සපුරා නැති බැවින් ලකුණු ලබාදීම සිදුනොකරන බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය තීරණය කිරීම වැරදි යැයි ප්‍රකාශ කිරීම සුදුසු නොවේ.

මෙම කරුණු වලට අමතරව අභියාචක අනිකුත් අයදුම්කරුවන් දෙදෙනා පිළිබඳව විවිධ චෝදනා ඉදිරිපත් කර සිටී. ඒ අය මෙම අධිකාරයට ඉදිරිපත් වී නැති බැවින්, ඒ පිළිබඳව විමසා බැලීම සුදුසු නොවේ. එසේම තම ආයතන ප්‍රධානීන් පිළිබඳවද විවිධ චෝදනා නගා තිබුවත්, ඒ පිළිබඳව මෙම කාරණයේ දි විමසා බැලීමට මෙම අධිකාරය කටයුතු කරන්නේ නැත. අභියාචකට ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම් හරහා එම ගැටළුව විසඳා ගැනීමට ඉඩ ප්‍රස්ථා පවතී. මෙම අධිකාරය විශේෂයෙන් සළකා බලන්නේ, මෙම ඉල්ලීම පිළිබඳව අභියාචකට යම්

අසාධාරණයක් සිදුවි ඇත්ද යන කරුණ පමණි. ඉහත සඳහන් සියළු කරුණු කෙරේ අවධානය යොමු කිරීමේ දි අභියාචකට අගතියක් සිදුවී ඇතැයි පැහැදිලිව පෙනි යන කරුණු ඉදිරිපත් වි නැත. එම නිසා ඉදිරිපත් කර ඇති ලේඛන අනුව නියමිත සුදුසුකම් සපුරා නැති බැවින්, මෙම කටයුතු වලදි අභියාචකට අගතියක් සිදුවී නැති බවට ප්‍රකාශ කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය තවදුරටත් තහවුරු කරමු. ඒ අනව අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු. මේ තීරණය අභියාචක, ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය ප්‍රතික්ෂේප කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-